*Vidyodaya J. Arts, Sci., Lett.*, Vol. 6 No. 1, 1978, pp. 40 – 46

# ගැමි සමාජය කුමක්ද?

**බී. ඒ. ටෙනිසන් පෙරේරා**

**සමාජවිද්‍යා අංශය, විද්‍යෝදය මණ්ඩපය**

ගැමි සමාජය හා ඔවුන්ගේ සංස්කෘතිය පිළිබඳ මානව විද්‍යාඥයින් හා සමාජ විද්‍යාඥයින් ආනුභවික (empirical) වශයෙන් අධ්‍යයනයන් ඉදිරිපත් කරන්නට උත්සාහ කළේ දෙවන ලෝක මහා යුද්ධයෙන් පසුව යයි කිවහොත් නිවරදය. මෙයට හේතු කීපයක් ඇත. පළමුව මෙතෙක් මානව විද්‍යාඥයින් අධ්‍යයන කළ ප්‍රාථමික සමාජ[1] ක්‍රමයෙන් තුරන්වී යාමත්, අනික් අතින් ආසියාතික ලතින් ඇමරිකානු රටවල කෘෂිකාර්මික වශයෙන් දිවි පෙවෙත ගත කරණ මිනිසුන්ගේ වත ගොත පිළිබඳ මානව විද්‍යාඥයින් වැඩිපුර අවධානය කිරීමත් හේතු කොට ගෙන මානව විද්‍යාවේ විෂය ක්ෂෙත්‍රය වෙනත් මඟකට යොමු විය.

මානව විද්‍යාව ආරම්භයේ සිට ප්‍රාථමික සමාජ අධ්‍යයනය කිරීමට මානව විද්‍යාඥයින් උත්සාහ කළත්, ආසියාවේ හා ලතින් ඇමරිකාවේ ගැමි සමාජ අධ්‍යයනය කිරීමට ඔවුන් උනන්දුවක් නොගන්නා ලදි. 1948 දී මානව විද්‍යාව පිළිබඳ නිර්දිෂ්ඨ ග්‍රන්ථයක් සැපයූ ඒ. එල්. ක්‍රෝබර් (A. L. Kroeber) පිටු අටසියයක් වූ එම ග්‍රන්ථයෙන් ගැමි සමාජය පිළිබඳ වෙන් කර ඇත්තේ එක ඡේදයකි.[2] එයද අහම්බෙන් කළ විමර්ශණයක් විය හැකියයි ජෝජ් එම්. ෆොස්ටර් (George M. Foster) පවසයි. යුරෝපියානු ගැමි සමාජ ආශ්‍රයෙන් ක්‍රෝබර් විසින් අදහස් ඉදිරිපත් කර ඇතැයි කියන ෆොස්ටර්, සමාජ ශාස්ත්‍ර පිළිබඳ විශ්ව කෝෂයේ ගැමි සමාජය විග්‍රහ කර ඇත්තේද, යුරෝපීය සමාජය ආශ්‍රයෙන් යයි පවසයි[3].

ගැමියන් නියෝජනය කරන්නේ අර්ධ සංස්කෘතීන්ගෙන් යුත් අර්ධ සමාජයක් යයි ක්‍රෝබර් සඳහන් කොට ඇත.[4] 'වෙළඳ මධ්‍යස්ථාන වලට සම්බන්ධව ජීවත්වන මේ ජනතාව අත්‍යවශ්‍යයෙන්ම ග්‍රාමීය වේ. එක්ව, සාමූහිකව ජීවත් වන, ස්වයංපෝෂිත ජීවන රටාවකට හිමිකම් කියන මෙම ජන කොටස තමන්ගේ පෞරාණික අනන්‍යතාවය රකිමින් ජීවත් වේ.' ක්‍රෝබර්ගේ උක්ත නිර්වචනය තුළින් අපට පෙනෙන්නේ ගැමි සමාජය හුදෙකලා සමාජයක් නොවන බවයි. අනිත් අතට එයින් ගම්‍ය වනුයේ ප්‍රාථමික සමාජ වලටත්, කාර්මික සමාජවලටත් අතරමැදි සමාජයක් බවයි.

ක්ලිෆර්ඩ් ගියර්ට්ස් (Clifford Geertz) සඳහන් කරන පරිදි සමාජ ලෝකයේ අමතක නොවන ජනතාවකි ගැමියන්. එහෙත් ඔවුන් පිළිබඳ මානව විද්‍යාඥයින් උනන්දු වූයේ ඉතා මෑතකදීයි.[5] න්‍යායාත්මක මානව විද්‍යාව කෙතරම් දුරට ගැමි සමාජ අධ්‍යයන කිරීම අතහැර තිබුණේද යත්, 1958 ෆීලික්ස් කීසින්ගේ (Felix Keesing) සංස්කෘතික මානව විද්‍යාව පිළිබඳ නිර්දිෂ්ඨ ග්‍රන්ථයේත්, 1959 මිෂ් ටිෂෙව්ගේ (Misch Titiev) සංස්කෘතික මානවවිද්‍යාවට හැඳින්වීමක් පිළිබඳ ග්‍රන්ථයේත් පමණි ගැමියන් පිළිබඳ සඳහන් කොට ඇත්තේ. ඒ දෙදෙනා පවා 'ගැමි' යන සංකල්පය 'ජන' සමාජය හා පටලවා ගෙන තිබෙන බව ෆොස්ටර් සඳහන් කරයි.[6]

අනිත් අතට රොබට් රෙඩ්ෆීල්ඩ් (Robert Redfield) සඳහන් කරණ පරිදි මෑතක් වන තුරුම ගැමි සමාජ අධ්‍යයන කිරීම මානව විද්‍යාඥයින්ගේ කාර්‍ය්‍යයක් නොවීය.[7] යුරෝපියානු ආසියානු ගැමි සමාජ පිළිබඳ ආර්ථික විද්‍යාඥයින් භූගෝල විද්‍යාඥයින් හා ඉතිහාසඥයින් වැඩිපුර උනන්දුවක් ගන්නා ලදී. ඔවුන් ගැමි සමාජ ව්‍යුහය අධ්‍යයනය කරණු වෙනුවට කෘෂිකාර්මික සංස්ථාවල ප්‍රභවය හා ඒවායේ භූගෝල හා ඓතිහාසික සාධක විමසීමට උත්සාහ කළ බව පෙනේ.

ගැමි සමාජය හා එහි ලක්ෂණ වඩා විස්තරාත්මක ලෙස අධ්‍යයනය කළ මානව විද්‍යාඥයින් කීප දෙනෙක්ම වෙති. රේමන්ඩ් ෆර්ත් (Raymond Firth), රොබට් රෙඩ්ෆීල්ඩ් (Robert Redfield) එරික් ආර්. වුල්ෆ් (Eric R. Wolf) හා ජෝජ් ෆොස්ටර් (George Foster) මෙම ගැමි සමාජ පිළිබඳ විවරණ ඉදිරිපත් කළ ප්‍රධාන අය ලෙස සැලකිය හැකිය[8].

රේමන්ඩ් ෆර්ත් මූලික වශයෙන්ම ආර්ථික නිශ්චායකයන්ට (Economic determinants) මුල් තැන දෙමින් ගැමි සමාජය නිර්වචනය කරයි. ඔහු සඳහන් කරණ පරිදි ගැමියන්ගේ මූලික ජීවන මාර්ගය තම ඉඩකඩම් වගා කර ගැනීමයි. ගැමියන්ගේ කෘෂිකර්මය හා ස්වයංපෝෂිත බාවයට අවධානයක් දෙමින් 'ගැමියා' යන වචනය පුළුල් අරුතින් විග්‍රහ කිරීමට ෆර්ත් උත්සාහ කරයි. කුඩා පරිමාණ දැ නිෂ්පාදනය කරණ ශිල්පීය කොටස් හා ධීවර මිනිසුන්, ගැමි සමාජයට අයත් බව ෆර්ත් වැඩි දුරටත් ප්‍රකාශ කරයි. කෘෂිකාර්මිකව යැපෙන්නන් මෙන් මේ අය එකම සමාජ පංතියකට අයත් වෙති. මේ සියල්ලෝම එකම පවුලේ සාමාජිකයින් වශයෙන් පෙනී සිටින බව ෆර්ත්ගේ අදහසයි[9].

ධීවරයන් හා අනෙකුත් ශිල්පීන් පසෙක තබා එරික් ආර්. වුල්ෆ් ගැමියන් වශයෙන් හඳුන්වන්නේ කෘෂිකාර්මික නිෂ්පාදකයන්ය. තමාගේ ඉඩම් හෝ තමා වගා කරණ ඉඩම් පරිපාලනය කරමින් යළි ආයෝජනයක් නොකොට යැපුම් මට්ටමෙන් ජීවත් වන ජන කොටස ගැමියන් වේය යනු වුල්ෆ්ගේ අදහසයි[10].

එරික් ආර්. වුල්ෆ් මෙන් රොබට් රෙඩ්ෆීල්ඩ්ද ගැමියන් පිළිබඳ කර ඇති නිර්වචනයෙන් ධීවරයන් කුඩා කර්මාන්ත ශිල්පීන් හා එඬේරුන් අත හැර දමා ඇත. 'කෘෂිකර්මය ගැමියන්ගේ ප්‍රධාන ජීවනෝපාය වී ඇත. එය ඔවුන්ගේ සංස්කෘතියේද කොටසකි. ලාභය සඳහා නිෂ්පාදනයක් නොකරණ ගැමි ජනතාව අතිශයින් දේශීය හා ග්‍රාමීය ජන කොටසක් වශයෙන් හැඳින්වීමට රෙඩ්ෆීල්ඩ් උත්සාහ කරයි. තමාගේ ඉඩම් ඉතා කාර්‍ය්‍යක්ෂමව පාලනය කරන ගැමියා සම්ප්‍රදය හැඟීම් මගින් ඒවාට සම්බන්ධ වී ඇත. දිගු කාලීන සම්බන්ධතාවයක් ඇති ගැමි ජනතාව එම ඉඩම් වලම ස්වාභාවික කොටස්කරුවෝ වෙති. ගැමි සමාජය නිර්වචනය කිරීමට රෙඩ්ෆීල්ඩ් ගත් උත්සාහයයි එය.[11]

'ගැමි සමාජය මහා සමාජයේ එක් ඒකකයකි. නැත්නම් අර්ධයකි.' මෙය ෆොස්ටර්ගේ අදහසයි. ප්‍රාග් කාර්මික ශිෂ්ඨාචාරයට හිමිකම් කියන අවම ලෙස මුදල් භාවිතයට ගන්නා, ශිල්ප විශේෂයන් ප්‍රගුණ කොට තිබෙන සමාජ ක්‍රමයක් ලෙස ගැමි සමාජය හැඳින්විය හැකි බව ෆොස්ටර් කියයි.[12] එක් අතකින් බලනකල ජෝජ් ෆොස්ටර් ගැමි සමාජය විග්‍රහ කිරීම සඳහා දී ඇති නිර්වචනය මීට පෙර මානව විද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති අර්ථ විවරණ වලට වඩා වෙනස්ය. වේගයෙන් වෙනස් වී ගෙන යන ලතින් ඇමරිකානු ගමක් ආශ්‍රයෙන් ෆොස්ටර් විසින් සිය නිර්වචනය ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත් ගැමි සමාජ පිළිබඳ තවත් කොතෙකුත් නිර්වචන තිබුණත් ගැමි සමාජය කුමක්ද? යන්න තේරුම් ගැනීමට ඉහත සඳහන් නිර්වචනය කෙනෙකුට ඉවහල් කරගත හැකිය. අනිත් අතට තියඩෝර් ශානින් (Theodore Shanin) නිවැරදිව සඳහන් කරන පරිදි ගැමි සමාජ පිළිබඳ පොදු නිගමනයකට එළඹීමට ඒ පිළිබඳ අධ්‍යයන කර ඇති මානව විද්‍යාඥයින් අසමත් වී ඇත.[13] විවිධ රටවල, විවිධ ප්‍රදේශවල හා නොයෙකුත් ගම්වල ජීවත්වන ජන කොටස් පිළිබඳ ඒ ඒ සමාජ ආර්ථික ප්‍රවර්ගයන් (Categories) උපයෝගී කොට දී ඇති නිර්වචන මගින් පොදු තීරණයක් ගැනීම උගහට වීම ස්වභාවයකි. මෙම ලිපියේ සඳහන් කර ඇති නිර්වචන එයට නිදසුන් වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

ගැමි සමාජ පිළිබඳ මානව විද්‍යාඥයින් පොදු නිගමන වලට නොඑළඹුනත්, එම සමාජවල දක්නට ලැබෙන පොදු ලක්ෂණ විග්‍රහ කිරීමට එය බාධාවක් නොවනු ඇත.

ගැමි සමාජ සංවිධානය දෙස බලන කල එය මූලික වශයෙන්ම ව්‍යූහාත්මක සම්බන්ධතා ගණනාවක් මත පදනම් වන බව පෙනේ. පළමුව ගම තුළම ඇති සම්බන්ධතා ස්වරූපය ගැමි ජනතාවගේ අනූකලනතාවයට (Integrity) හා අඛණ්ඩ සම්ප්‍රදයට (Continued tradition) උරුමකම් කියයි.

පැහැදිලිවම පෙනෙන පරිදි ඕනෑම ගැමිසමාජයක 'පවුල' නැමති සමාජ සංස්ථාව ප්‍රධාන වේ. නවීන සමාජවල දක්නට ලැබෙන 'මූලික පවුල' වෙනුවට විස්තාරිත පවුල් ක්‍රමයක්[14] ගැමි සමාජවල දැකිය හැක. දරුවන් සමාජානුයෝජනය (Socialization) කිරීමේදී මූලික වශයෙන්ම ග්‍රාමීය පවුල ප්‍රධාන තැනක් ගනී. අනිත් අතින් නිෂ්පාදන හා පරිභෝජන ඒකකය වශයෙන් ගැමි පවුල ප්‍රධාන වේ. වයස හා ලිංගික කරුණු පදනම් කොට ගෙන ගැමිජන කොටස් නිෂ්පාදන ක්ෂේත්‍රයට සම්බන්ධ වේ. තමාගේ පරිභෝජනය සඳහා නිෂ්පාදන කටයුතු මෙහෙය වන ගැමි ජනතාවගේ ආර්ථික ජීවිතය පවුල් ඒකක තුළ රඳා පවත්නා බව කිව හැකි අතර, සෑම ගැමි සමාජයකම තත්ත්වය මෙය වේ.

ගැමි පවුල් ක්‍රමය මෙන්ම, ගම් මට්ටමේ අනෙකුත් සංස්ථා අතරද අන්‍යොන්‍ය වශයෙන් සබඳතා පවතී. ගමේ සමාජ සංවිධානය තීරණය කරණ මෙම සංස්ථා අර්ථ ක්‍රමය, දේශපාලනය හා ආගමික සබඳතා වේ.

ගැමි සමාජයේ ආර්ථික ක්‍රමය බලන විට පොදුවේ එය කෘෂිකර්මය මූලික කරගත් බව පෙනේ.[15] මෙහිදී මුලින් සඳහන් කළාක් මෙන් පවුල් සංස්ථාව ආර්ථික ක්ෂේත්‍රයේ ප්‍රධාන තැනක් ගනී. ආර්ථික කටයුතු වලදී ස්වාභාවික ලෝකයට සම්බන්ධවෙමින් විවෘත වෙළඳ පොලකින් ගත නොහැකි නිෂ්පාදන උපකරණ ගැමියන් විසින් භාවිතා කරන බව පෙනේ.[16] ඇතැම් ගැමි සමාජවල මුදල් හුවමාරුව ව්‍යාප්ත වී තිබෙන අතර සමහරක මුදල් භාවිතය එතරම් ව්‍යාප්ත වී නැත. බොහෝවිට නිෂ්පාදනය පරිභෝජනය සඳහා පවතින ගැමි සමාජයේ අතිරික්තයක් නිපදවුවහොත් එය වෙළඳ පොළට සපයනු ලැබේ. කෙසේ වෙතත් නවීන සමාජයේ දැකගත හැකි ඉල්ලුමේ හා සැපයුමේ දැඩි තරඟයක් ගැමි සමාජවල දක්නට නොමැත.

සාමාන්‍යයෙන් ගැමි අර්ථ ක්‍රමය මහා පරිමාණ ව්‍යවසායන් මත පදනම් නොවේ. ලාභය පිළිබඳ අභිප්‍රේරණයක් ගැමි ජනතාව තුළ දක්නට නොලැබෙන හෙයින් තරඟකාරී වෙළඳ පොළක් ගැනද ගම් මට්ටමේ කතා කළ නොහැකිය. සරල තාක්ෂණ ක්‍රම උපයෝගී කොටගෙන සුළු පරිමාණ නිෂ්පාදන කාර්යයන් වලට සහභාගී වන ගැමි ජනතාව නාගරික වෙළඳ මධ්‍යස්ථාන වලට සම්බන්ධ වන්නේ කාලීන වශයෙනි.

දේශපාලනික වශයෙන් බලන කල ගැමි සමාජයේ පාලන තන්ත්‍රය ක්‍රියාත්මක වනුයේ මහ සමාජයේ මධ්‍යගත පාලනය මගිනි. ප්‍රාදේශීය වශයෙන් බලන කල පීතෘ මූලික ගැමි සමාජයේ සම්ප්‍රදායානුගත බලය වැඩිහිටියන් සතුව පවතින බව කිව හැකිය. කෙසේ වුවත් දේශපාලනික වශයෙන් බලය රහිත සමාජ කොටසක් වශයෙන් ගැමියන් හැඳින්වීම යුක්ති යුක්ත වේ.

ගැමි සමාජ ව්‍යුහය තුළ ගමට අයත් නොවන ප්‍රබුද්ධ කොටස් ගමේ පරිපාලන කටයුතු-වල නිරතවනු පෙනේ. ඇත්තෙන්ම මේ අය ගැමියන් සමඟ සම්බන්ධකම් පවත්වන්නේ ද්විතික වශයෙනි. ඇතැම් අවස්ථාවල මේ ප්‍රබුද්ධ කොටස් ගමට එන්නේද කලාතුරකිනි. බොහෝවිට තමන්ගේ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ගැමියන්ට නගරයට යාමට සිදුවේ. යුකටාන් (Yucatan) ගම අධ්‍යයන කළ රෙඩ්පීල්ඩ් පවසන්නේ, එම ගමේ සිටින එකම බාහිර පුද්ගලයා රජයේ ගුරුවරයා බවයි.[17]

හුදෙකලා හෝ බාහිර ලෝකයෙන් වෙන් වූ සමාජ ක්‍රමයක් ලෙස ගැමි සමාජය හැඳින් විය නොහැකිය. ප්‍රාදේශීය හෝ ජාතික රාජ්‍යය සමග ගැමියන් විවිධ කාර්‍යයන් හා පාලන අවශ්‍යතාවයන් සඳහා අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධතා පවත්වා ගෙන යනු පෙනේ. ජෝජ් ෆොස්ටර් සඳහන් කරන පරිදි ලතින් ඇමරිකානු ජනකොට්ඨාශවල ගැමියන්, ප්‍රබුද්ධයන් හා අනෙකුත් නාගරික පාලකයන් සමග අඛණ්ඩ සම්බන්ධතා ඇති කරගෙන ඇත.[18]

ගම හා බාහිර ලෝක අතර පවතින සමාජ සංස්කෘතික හා පරිපාලන සම්බන්ධතාවය සංකල්ප දෙකක් ආශ්‍රයෙන් විමසා තිබෙන බව පෙනේ. රොබට් රෙඩ්පීල්ඩ් විසින් ඉදිරිපත් කර ඇති මේ සංකල්ප දෙක මහාසම්ප්‍රදය (Great Tradition) සහ චූල සම්ප්‍රදය (Little Tradition) වේ[19]. මහා සම්ප්‍රදය පාසැල්වල හා පන්සල්වල ව්‍යාප්තව පවතී. අපේ රටේ මහ සම්ප්‍රදය ගැන කතා කරන විට එය පැරණි සාහිත්‍ය ග්‍රන්ථ වලින් දැක ගත හැකිය. මහාවංශය හා චූලවංශය වැනි වංශ කතා මහා සම්ප්‍රදයේ අතීත කතාන්තරය මොනවට පිළිබිඹු කරයි. ගැමියන්ගේ යන්ත්‍ර මන්ත්‍ර, හා මිථ්‍යා අදහස් චූල සම්ප්‍රදය නියෝජනය කරයි. කෙසේ වෙතත් මේ සම්ප්‍රදයයන් දෙකම අතර සම්-බන්ධයක් පවතී. දිගු කාලයක් තිස්සේ මේ සම්ප්‍රදයයන් දෙක එකිනෙකට බලපා ඇත.

පරිපාලන වශයෙන් බලන විට ගම කෙරෙහි බලපාන බාහිර ශිෂ්ඨාචාරයේ බලපෑම් ඇත. ඉහතින් සඳහන් කළාක් මෙන් ගමේ පරිපාලන කටයුතුවල බොහෝවිට නිරත වන්නේ බාහිරින් පැමිණෙන පුද්ගලයන් විසිනි. ග්‍රාම සේවක, ප්‍රාදේශීය ආදායම් පාලක, ඉඩම් සංවර්ධන නිලධාරි ආදී අය මධ්‍යගත රජයෙන් පත් කොට ගමේ පාලනයට පැමිණි අයයි. ගම හා මධ්‍යගත පාලනය සම්බන්ධ කරණ නියෝජිතයින් වශයෙන් මේ අය හැඳින් විය හැකිය.

කෙසේවතුදු ගමේ ඒකීය බවක් දක්නට ඇත. ආගමික වශයෙන් බලන කල වෛදික කටයුතු කරන්නේ ගමේ නියෝජිතයින් විසිනි. ගමේ කඩය, ගමේ සීමාව යන අදහස ගැමියන් තුළ දක්නට තිබීම නිසා ගම පිළිබඳ අනන්‍යතාවයක්ද ඇත. එම්. එන්. ශ්‍රී නිවාස් (M. N. Srinivas) වැනි මානව විද්‍යාඥයින් පවසන අන්දමට ඉන්දීය ගමක් අධ්‍යයනය කිරීමෙන් ඉන්දියාවට පොදු ලක්ෂණ වටහා ගත හැකි බවයි.[20] මෙය අනෙ-කුත් ග්‍රාමීය සංස්ථාවලටද පොදුය. තවත් මානව විද්‍යාඥයින් පිරිසක් පවසන්නේ ඉන්දි-යාවේ ප්‍රධාන සංස්ථා වන කුලය, බද්ධ පවුල අධ්‍යයනය කිරීමෙන් එහි පොදු ලක්ෂණ

අවබෝධ කරගත හැකි බවයි. පැහැදිලිව විමසන කල ගමක සමාජ තත්ත්වය අවබෝධ කර ගැනීමේදී එම ගම කෙරෙහි බලපාන අභ්‍යන්තර හා බාහිර සාධක විශ්ලේෂණය කිරීම වැදගත් වනු ඇත.

ගැමි සමාජය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේදී ආගමික අංශයද වැදගත් වනු ඇත. මහා සම්ප්‍රදාය හා චූල සම්ප්‍රදාය අන්‍යෝන්‍ය ලෙස ක්‍රියාත්මක වන එක් ක්ෂේත්‍රයක් ලෙස ආගම සඳහන් කළ හැකිය. උදාහරණයක් වශයෙන් ලංකාවේ ගැමි සමාජය තුළ තිර ලෙසට බුද්ධාගම ව්‍යාප්ත වී ඇත. ඇත්තෙන්ම ගම් මට්ටමේ ක්‍රියාත්මක වන බුද්ධාගම, තුන් පිටකයේ සඳහන් වන බුද්ධාගමට බොහෝ වෙනස් වේ. ආමිෂ පූජාවට මුල් තැන දෙන ජනප්‍රිය බුද්ධාගම ගැමියන් අතර වඩා ප්‍රචලිත වන බව පෙනේ. පෙරහැර යාම හා නොයෙකුත් වන්දනා ක්‍රම ජනප්‍රිය බුද්ධාගමට සම්බන්ධ වී ඇත. ගැමියන්ගේ පුද පූජා යන්ත්‍ර මන්ත්‍ර බලි තොවිල් හා දෙවියන් ඇදහීම ජනප්‍රිය බුද්ධාගමේ ප්‍රධාන අංග ලෙස සකස් වී තිබෙන බව කිව හැක.

ගම තුළ නියෝජනය වන දෙවියෙක් හෝ දේවතාවරු ගණනාවක් දක්නට ඇත. ගැමියන්ගේ විවිධ ප්‍රශ්න වලට පිළියම් සෙවීමේදී අධි ස්වාභාවික වශයෙන් දෙවියන්ගේද උපකාරය ලබා ගැනීම සඳහා ඔවුන් ඒවායේ නිරත වනු පෙනේ. ගැමියන්ගේ අසනීප හා ව්‍යාධි තුරන් කර ගැනීම සඳහා දෙවියන්ට භාර භාර වීම නිරතුරුවම දැකිය හැකිය. එකිනෙක ප්‍රශ්න පිළිබඳ විශේෂ දෙවිකෙනෙක් දක්නට ඇත. ගම් මට්ටමේ නියෝජනය වන දෙවිවරු සිට ජාතික මට්ටමේ නියෝජනය වන දෙවිවරු පිළිබඳ දැඩි විශ්වාසයකින් ගැමියන් සිටින බව පෙනේ. මෙය දකුණු ආසියාතික ගැමි සමාජවල පොදු ලක්ෂණයක් යයි කිව හැකිය. ගම් මට්ටමේ ක්‍රියාත්මක වන ආගමික ක්‍රියා පිළිවෙල අතිශයින්ම සංකීර්ණ වී ඇත. සමාජීය වශයෙන් මෙන් ගමේ ඇදහිලි වලදීද දෙවියන් අතර ධූරාවලියක් ඇතිවී ඇත. කෙසේ වෙතත් එම ධූරාවලියේ මුල් තැන ලැබී ඇත්තේ බුදුන් වහන්සේටය.

විග්‍රහාත්මකව බලන කල සම්ප්‍රදායානුගත ගැමි සමාජ දැන් වෙනස්වීගෙන යන තත්ත්වයකට පැමිණ ඇත. දියුණුවන ලෝකය ඉදිරියේ ගැමි ජනතාවගේ ප්‍රශ්න ව්‍යාප්ත වී තිබෙන බව පෙනේ. ගියර්ට්ස් සඳහන් කරන පරිදි[21] මානව විද්‍යාත්මක ක්ෂේත්‍රයේ ගැමි සමාජ අධ්‍යයන කිරීම වැදගත් වී ඇති අතර එය මූලික ප්‍රශ්නයක්ද වී ඇත. බටහිර කාර්මීකරණ ආභාෂය නිසා ගැමි සමාජ වෙනස් වන තත්වයකට පත්ව ඇත. ඇත්තෙන්ම ගැමියන් වෙනස්වීමක් බලාපොරොත්තු වන බව පෙනේ. දුගීකම, නූගත්කම, අසරණ භාවය හා රෝගීත්වයට ගොදුරුවීම සාමාන්‍ය ගැමි ජීවිතයේ දක්නට ලැබෙන සුලබ දෙයකි. මේවායින් බේරී නාගරික සමාජ ජීවිතයට හිමිකම් කීමට ගැමියෝ දැන් දැන් උත්සුක වෙති. නවීන තාක්ෂණය මගින් ඇති කරන ලද මානව ආශාවන් වලට ගැමියාටද අනාගතයේ වහල් වීමට සිදුවිය හැකියයි සිතිය හැකිය.

1. ප්‍රාථමික සමාජ විවිධ නම් වලින් මානව විද්‍යාඥයින් විසින් හඳුන්වා ඇත. සරල සමාජ, අලිඛිත සමාජ, ශෝත්‍රික සමාජ මේ නම් වලින් කීපයකි.

Max Gluckman :– *Politics, Law and Ritual in Tribal Society.* Manchester University Press. 1965. Introduction.

2. A. L. Kroeber – *Anthropology 1948*; p. 284
3. George Foster :– 'Introduction – what is a peasant' in *Peasant Society – A Reader* (ed) Jack M. Potter, May N. Diaz George M. Foster, 1967 p. 2.
4. Kroeber op cit. 1948 p. 284
5. Clifford Geertz. "Studies in Peasant Life; community and Society. *Bienniel Review of Anthropology,* (ed) B. J. Siegel. Stanford University Press. 1962 . Pp. 1 – 41
6. Foster op cit. 1967 p. 3.
7. Robert Redfield – *Peasant Society and Culture* 1956. p. 19
8. Raymond Firth – *Malay Fishermen: Their Peasant Economy.* 1946.
   Eric R. Wolf – *Peasants.* 1966.
   Robert Redfield :– *Peasant Society and Culture.* 1956
   George M. Foster – "What is folk Culture."
   *American Anthropologist* 55, 1953 pp. 159–173.
9. Firth op cit. 1946 p. 22
10. Wolf op cit. 1966. Chapter 1.
11. Redfield op. cit 1956 p.27.
12. Foster. 1967 p. 5.
13. Theodore Shanin. (ed) *Peasant and Peasant Societies,* Penguin 1971. p. 12. ඇත්ත වශයෙන් මෙම අදහස දක්නට ලැබෙන්නේ මේ පොතට සංස්කාරක වශයෙන් දෙන ලද හැඳින්වීමෙහිය.
14. හින්දු ඉන්දියාව ගත් කල බද්ධ පවුල වෙනුවට විස්තාරිත පවුල දැක ගත හැකිය.
15. මේ හැර ධීවර අර්ථ ක්‍රමය පදනම් කොට ගත් ගැමි සමාජදවේ. මේ සඳහා හොඳම නිදසුන. R. Firth – *Malay Fishermen,* 1946.
16. F. G. Bailey – *Caste and Economic frontier,* 1957.
17. Redfield. op cit. 1959 p. 61.
18. Foster op cit. 1953, p. 169.
19. Redfield op. cit, 1956 p. 70.
20. M. N. Srinivas – "Social Structure of a Mysore Village" in Mckim Marriot, (ed.) *Village India,* 1955.
21. Geertz. op cit. 1956 p. 5

## ආශ්‍රිත ග්‍රන්ථ

1. Firth, Raymond, *Malay Fishermen* London. 1946. Second Ed. 1966
2. Potter, Jack M.
   May, N. Diaz
   George M. Foster (ed.) *Peasant Society; A. Reader*. Little Brown & Co. 1967.
3. Redfield, Robert, *Peasant Society and Culture.* Chicago. 1956.
4. Shanin, Theodore (ed.) *Peasant and Peasant Societies.* Penguin.
5. Wolf, Eric R. *Peasants.* Prentice Hall N. J. 1966.